දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# ආයුර්වේද වෛද්‍ය සභාව

# කාර්ය සාධන වාර්තාව - 2013

# පටුන



| | |
|---|---|
| ආයුර්වේද වෛද්‍ය සභාවේ දැක්ම, මෙහෙවර හා පරමාර්ථය | 4 |
| අභිමතාර්ථ, ආයුර්වේද වෛද්‍ය සභාවේ හැදින්වීම හා කාර්යභාරය | 5 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සාමාජිකයින් 2013 | 6 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය | 7 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය | 8 |
| මූල්‍ය සම්පාදනය | 8 |
| ප්‍රතිපත්ති සම්පාදනය හා අතිරේක සුදුසුකම් | 9 - 10 |
| විමර්ශණ හා විශේෂ වෛද්‍ය මණ්ඩල | 11 |
| ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම හා භෛෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම, ව්‍යවස්ථා සම්පාදනය, හෙළවෙද රුවනාර වැඩ සටහන | 11 - 17 |
| ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය | 17 - 18 |
| 2013 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මගින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් පියවර | 18 - 20 |
| 2013 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය | 21 - 23 |
| 2013 මූල්‍ය තත්ව ප්‍රකාශනය හා ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම | 24 - 26 |
| 2013 මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 27 - 28 |
| 2013 විගණකාධිපති වාර්තාව | 29 -37 |
| 2013 විගණකාධිපති වාර්තාව සඳහා යොමු කළ පිළිතුරු වාර්තාව | 38 - 41 |
| සංස්ථාපිත තොරතුරු | 42 |
| ස්තුතිය | 43 |

**දැක්ම**

වෘත්තීය ගුණාත්මකභාවය හා
අභිමානය සුරක්ෂිත කරමින්
ශ්‍රී ලංකා ආයුර්වේද ක්ෂේත්‍රයේ උත්තරීතර
ආයතනය බවට පත්වීම.

**මෙහෙවර**

වෘත්තීය ආචාරධර්ම වලට අනුගත වූ උපරිම
මහජන සේවාවක් සලසමින්
ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මක සංවර්ධනය
සඳහා අවශ්‍ය නෛතික පදනම සුරක්ෂිත කිරීම.

**පරමාර්ථය**

1961 අංක 31 දරණ ආයුර්වේද පනතෙහි
විධිවිධාන වලට අනුකූලව ආයුර්වේද ක්ෂේත්‍රයේ
ගුණාත්මක සංවර්ධනය සංස්ථාපනය කිරීමට අවශ්‍ය
දැනුම, කුසළතාවය හා පළපුරුද්ද සහිත
වෘත්තිකයින් වෙත
නෛතික අධිකාරිත්වය පිරිනැමීම
සහ වෘත්තියේ ගරුත්වය සහ ගුණාත්මකභාවය
සුරක්ෂිත කිරීම.

**අභිමතාර්ථ ඃ-**

1. 1961 අංක 31 දරණ ආයුර්වේද පනතින් සභාවට පවරා ඇති බලතල බලාත්මක කිරීම.
2. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිමය නිපුණත්වය නගාලීමට ප්‍රමිති / නිර්ණායක සකස් කිරීම හා පවත්වාගෙන යාම.
3. ආයුර්වේද වෘත්තිකයන්ගේ චර්යාව විධිමත් ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය ආචාරධර්ම හා ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීම.
4. ආයුර්වේද ක්ෂේත්‍රයේ වෘත්තිය චර්යාවන් නිර්ණය කිරීම හා පාලනය කිරීම.
5. ආයුර්වේද වෛද්‍ය සභාවේ සම්පත් හා පහසුකම් යාවත්කාලීන කිරීම මඟින් එහි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම.

**<u>1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපිත ආයුර්වේද වෛද්‍ය සභාවේ හැදින්වීම හා කාර්යභාරය</u>**

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරණ ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරණ ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දැනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යභාරය ;

(අ). ආයුර්වේදය උගන්වන යම් ආයතනයක් මේ පනතේ කාර්යයන් සඳහා ඇමතිවරයා විසින් අනුමත කළ යුතුද යන්න ඇමතිවරයාට නිර්දේශ කිරීම.

(ආ). ආයුර්වේද වෛද්‍යවරුන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඇ). ආයුර්වේද ඖෂධ සංයෝජකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඈ). ආයුර්වේද සාත්තු සේවකයන් වශයෙන් තැනැත්තන්ගේ නම් ලියාපදිංචි කිරීම.

(ඉ). එසේ ලියාපදිංචි කිරීම් අවලංගු කිරීම හෝ අත්හිටුවීම, හා

(ඊ). 1. ආයුර්වේද වෛද්‍යවරුන, ආයුර්වේද ඖෂධ සංයෝජකයන් හා ආයුර්වේද සාත්තු සේවකයින්ගේ වෘත්තිය හැසිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම සඳහා,

2. මේ වගන්තියේ (ආ) සිට (ඉ) දක්වා ඡේදවල සඳහන් කරුණු වලින් යමක් සඳහා ව්‍යවස්ථා සම්පාදනය කිරීම.


**2013 වර්ෂයේ 17 වන වෛද්‍ය සභාවේ සභා සාමාජිකයින්**

| | | |
|---|---|---|
| 1. | **ආයුර්වේද කොමසාරිස්, පී. එස්. කේ. ආර්. වීරකෝන් මයා** | **සභාපති** |
| 2. | ආචාර්ය, ඩී. ජේ. යූ. පුරසිංහ මයා | උප සභාපති |
| 3. | වෛද්‍ය බැසිල් රංජිත් ප්‍රනාන්දු මයා ( **2013.07.10 දක්වා** ) | ලේඛකාධිකාරී |
| 4. | වෛද්‍ය ආර්. එල්. රණසිංහ මයා | ලේඛකාධිකාරී |
| 5. | සුනිමල් සේනාරත්න මයා<br>අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යායතනය ( **2013.08.17 දක්වා** ) | සාමාජික |
| 6. | මහාචාර්ය, කේ. කේ. ඩී. එස්. රණවීර මයා<br>අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යායතනය ( **2013.11.08 දක්වා** ) | සාමාජික |
| 7. | වෛද්‍ය ඩබ්. එම්. එස්. ජේ. කුමාරි මෙය -<br>අධ්‍යක්ෂ, දේශීය වෛද්‍ය විද්‍යායතනය | සාමාජික |
| 8. | මහාචාර්ය, ජනිතා ඒ. ලියනගේ මිය<br>අධ්‍යක්ෂ, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය | සාමාජික |
| 9. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය ඩී. පී. ඒ. දිසානායක මයා | සාමාජික |
| 10. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, වෛද්‍ය ටී. ඩී. එන්. කරුණාරත්න මයා | සාමාජික |
| 11. | වෛද්‍ය එස්. එච්. එම්. සේනබණ්ඩා මහතා | සාමාජික |
| 12. | වෛද්‍ය චන්ද්‍රසිරි විතානාරච්චි මයා | සාමාජික |
| 13. | එම්. එම්. ඒ. දේව් සිරිවර්ධන මයා | සාමාජික |
| 14. | වෛද්‍ය ඊ. එම්. පී. බී. ඒකනායක මයා | සාමාජික |
| 15. | වෛද්‍ය එම්. එම්. ඒ. කේ. අමරසිංහ මයා | සාමාජික |
| 16. | වෛද්‍ය සුනිල් ශාන්ත විජේතුංග මයා | සාමාජික |
| 17. | වෛද්‍ය එම්. සෙයිනුදීන් මයා | සාමාජික |
| 18. | වෛද්‍ය එම්. එම්. කේ. මාලිංගාව මයා | සාමාජික |
| 19. | භාණ්ඩාගාර නිරීක්ෂක, එම්. ආර්. ආර්. අබේවික්‍රම මිය<br>අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව | සාමාජික |

මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීම් 10 ක් පවත්වා ඇත.

## ආයුර්වේද වෛද්‍ය සභාවේ සංවිධාන ව්‍යුහය

**සාමාජික සංඛ්‍යාව**



## ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය - 2013

### 01. මූල්‍ය සම්පාදනය


2013 වර්ෂය වෙනුවෙන් ආයුර්වේද වෛද්‍ය සභාව වෙත රුපියල් ලක්ෂ පනහක **(5,000,000/-)** මුදලක් රජයේ ප්‍රතිපාදන වශයෙන් ලබා දී ඇත.

2013 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාව වෙත විවිධ ක්ෂේත්‍රයන් මගින් ලැබූ ආදායම **රු. 4,423,074/-** ක් වූ අතර මුළු වියදම **රු. 8,423,873/-** ක් විය. 2013 වර්ෂයේ ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් ආදායම් වියදම් ගිණුමෙන් ද 2013.12.31 දිනට සභාවේ මූල්‍ය තත්වය පිළිබඳ වාර්තාවක් ශේෂ පත්‍රයෙන් ද ඉදිරිපත් කර ඇත. මීට අමතරව 2013 වර්ෂය තුළ මුදල් ගලා ඒම හා ගලායාම පිළිබඳ තතත්වය මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය **මගින්** ඉදිරිපත් කර ඇත.

**වාර්ෂික ආදායම, වියදම හා රජයේ ප්‍රතිපාදන**

| අයිතමය | 2009 රුපියල් | 2010 රුපියල් | 2011 රුපියල් | 2012 රුපියල් | 2013 රුපියල් |
|---|---|---|---|---|---|
| රජයේ ප්‍රතිපාදන | 3,700,000.00 | 6,000,000.00 | 3,900,000.00 | 4,700,000.00 | 5,000,000.00 |
| උපයාගත් ආදායම | 2,269,278.00 | 2,205,626.00 | 1,900,665.00 | 2,361,369.00 | 4,423,774.00 |
| **මුළු ලැබීම** | **5,969,278.00** | **8,205,626.00** | **5,800,665.00** | **7,061,369.00** | **9,423,774.00** |

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රජයේ ප්‍රතිපාදන හා අනෙකුත් ආදායම් පිළිබඳ විස්තරයක් පහත ප්‍රස්තාරය **මගින්** දක්වා ඇත.



## 02. ප්‍රතිපත්ති සම්පාදනය

ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් 2013 වර්ෂයේ පහත සඳහන් ස්ථාවර අනුකමිටු ක්‍රියාත්මක කරන ලදී.

- **විභාග පාලක මණ්ඩලය - ස්ථාවර අනු කමිටු**
- **දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටු**

**විභාග පාලක මණ්ඩලය**

විභාග පාලක මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ලිඛිත පරීක්ෂණය 2013. **ඔක්තෝබර් මස** 05 හා 06 දිනයන්හී නුගේගොඩ, අනුලා විද්‍යාලයේ දී පවත්වන ලදී.

**2009 සිට 2013 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මගින් පවත්වන ලද ලිඛිත පරීක්ෂණ**

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා කැඳවූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 275 | 402 | 319 | 231 | 373 |
| ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගි වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 199 | 296 | 193 | 151 | 293 |
| ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව | 43 | 110 | 53 | 51 | - |
| ලිඛිත පරීක්ෂණයෙන් ඌන සමත් අයැදුම්කරුවන් සංඛ්‍යාව | 13 | 49 | 61 | 40 | - |
| **සහභාගි වූ අයැදුම්කරුවන්ගෙන් සමත්වීමේ ප්‍රතිශතය** | **21.61%** | **37.16%** | **27.46%** | **33.77%** | **ප්‍රතිඵල නිකුත් කර නැත** |

## දණ්ඩනීය අවස්ථා පිළිබඳ කාරක සභාව - ස්ථාවර අනු කමිටුව

දණ්ඩණීය අවස්ථා පිළිබඳ කාරක සභාව 1961 අංක 31 දරණ පනතේ 10, 18 සහ 82 වගන්තිය ප්‍රකාර පනවා ඇති 1973 ආයුර්වේද (විනය) නියෝග වලට අනුගතව පිහිටුවා ඇති ස්ථාවර සභාවකි. එහිදී අනුගමනය කළ යුතු ව්‍යවස්ථානුගත ක්‍රියාවලිය 1973.01.04 දිනැතිව පළ කර ඇති අතර එය සාමාන්‍ය විනය පරීක්ෂණයට බෙහෙවින් සංකීර්ණ වූත් වගකීම් සහිත වූත් නෛතික විමර්ශන ක්‍රියාවලියකි.

2013 වර්ෂයේ මෙම කාරක සභාව 02 වරක් රැස්වෙන ලද අතර එහිදී බටහිර වෛද්‍ය ප්‍රතිකාර කිරීම සම්බන්ධයෙන් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණයේ වැරදි පිළිගැනීම සම්බන්ධව, ලියාපදිංචි අංක 10913 (ඩී.එස්.ඒ.එම්.එස්) යටතේ ලියාපදිංචිය ලබා ඇති වෛද්‍ය ඒ. ආර්. ඉළුක්කුඹුර මහතාගේ ලියාපදිංචිය 2013.07.10 සිට මාස 03 ක කාලයක් සඳහා අත්හිටුවන ලදී.

තවද ව්‍යාජ ලෙස වෛද්‍ය සහතික නිකුත් කිරීම සම්බන්ධව, අංක 5570 යටතේ ලියාපදිංචි ආර්. එන්. ඩී. එස්. වීරමන්ත්‍රී මහතා චෝදනා විමර්ශනය කිරීම සඳහා දණ්ඩනීය අවස්ථා කාරක සභාවට පෙනී නොසිටිය බැවින් ඒකපාර්ශවිකව පරීක්ෂණය නිම කොට ලියාපදිංචිය අත්හිටුවා ඇත. ඒ බව කැස්බෑව ප්‍රාදේශීය ලේකම් මඟින් භාරදීමට කටයුතු යොදා ඇත.

## ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ අතිරේක සුදුසුකම් නිර්ණය කිරීමේ අනුකමිටුව

1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 62 වන වගන්තිය අනුව ලියාපදිංචි යම් ආයුර්වේද වෛද්‍යවරයෙකු හට තම ලියාපදිංචියෙන් පසුව ලබා ගන්නා වෘත්තියට අදාළ යම් සුදුසුකමක් අතිරේක සුදුසුකමක් ලෙස සභාව පිළිගත් විට එය නාම ලේඛනයට ඇතුළත් කිරීමේ බලය හිමිවේ. ඒ අනුව එම අතිරේක සුදුසුකම සඳහා සභාව විසින් නිකුත් කරනු ලබන සහතිකයක් දැරීමටත්, සිය නම සමඟ ප්‍රදර්ශනය කිරීමටත්, එම අතිරේක සුදුසුකම වෘත්තිය කටයුතු සඳහා භාවිතා කිරීමටත් නෛතික හිමිකම තහවුරු කරනු ලබයි. ආයුර්වේද වෛද්‍ය සභා තීරණය පරිදි මෙම වගන්තියේ විධිවිධාන අනුව අතිරේක සුදුසුකම් ලියාපදිංචි කිරීම ආරම්භ කර ඇති අතර මේ වන විට ඒ පිළිබඳව අදාළ පාර්ශවයන් දැනුම්වත් කර තිබේ.

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| අතිරේක සුදුසුකම් ඇතුළත් කොට සහතික නිකුත් කර ඇති සංඛ්‍යාව | 16 | 05 | 09 | 04 | 03 |

## 03. විමර්ශන කටයුතු

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්ගේ වෘත්තීය විෂමාචාර මෙන්ම ලියාපදිංචි නොවූ ආයුර්වේද වෛද්‍යවරුන් ලෙස පෙනී සිටින තැනැත්තන් සම්බන්ධයෙන් කරනු ලබන පැමිණිලි සොයා බලා අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මහජන පැමිණිලි විමර්ශන ඒකකයක් පිහිටුවා ඇත. එම වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අක්‍රමිකතා, වෘත්තීය විෂමාචාර, ආයුර්වේද ආචාරධර්ම වලට පටහැනිව ක්‍රියා කිරීම ආදිය විමර්ශනය මෙහි මූලික අරමුණයි. සභාවේ මෙම කාර්යය පුවත්පත් දැන්වීම්, පැමිණිලි හා මහජන පැමිණිලි වශයෙන් වෙන්කොට විමර්ශනය සඳහා යොදා ගැනේ.

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| විමර්ශනය කර ඇති පැමිණිලි සංඛ්‍යාව | 25 | 08 | 14 | 04 | 14 |

## 04. විශේෂ වෛද්‍ය මණ්ඩලය

රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු සේවකයින් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxvi වන පරිච්ඡේදයේ 4 වන වගන්තිය අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන වෛද්‍ය මණ්ඩලයට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සහතික සම්බන්ධයෙන් අදාළ විශේෂ වෛද්‍ය මණ්ඩල පවත්වනු ලැබේ. ඒ පිළිබඳව සොයා බැලීම සඳහා ඒ ඒ ආයතන මඟින් වෛද්‍ය සභාවට පොදු 142 ආකෘති පත්‍රය සම්පූර්ණ කර එවනු ලැබේ.

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| පවත්වා ඇති විශේෂ වෛද්‍ය මණ්ඩල සංඛ්‍යාව | 16 | 05 | 05 | 03 | 04 |

## 05. පනතේ 55 (1) හා 55 (2) වගන්ති යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද වෛද්‍ය සභාව පහත සඳහන් මූලික ප්‍රතිපත්ති මත වෛද්‍යවරු ලියාපදිංචිය සිදු කරයි.

- ආයුර්වේද වෛද්‍ය උපාධිධාරීන්, අභිඥාණපත්‍රධාරීන් සහ රජය පිළිගත් සහතික පත්‍රධාරීන් සුදුසුකම් අනුව ලියාපදිංචි කිරීම.
- ආයුර්වේද වෛද්‍ය සභාව සම්මත කරනු ලැබූ ව්‍යවස්ථාව අනුව සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල හා නිර්දේශ අනුව සුදුසුකම්ලත් පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම

සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයා ලබා ගන්නා ලකුණු ප්‍රමාණය අනුව ශ්‍රේණිගත කිරීමක් සිදුකරන අතර පරීක්ෂණයෙන් අසමත් වන අයැදුම්කරුවන් ඔවුන්ගේ ලකුණු ප්‍රමාණය අනුව මාස තුනක, මාස හයක හා වසරක් ආදී වශයෙන් ඇගැයුම් කාලයකට යටත් කොට නැවත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

2013 වර්ෂය අවසන් වන විට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව 23614 කි. මෙම වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍යවරුන් 348 දෙනෙකු පහත සඳහන් අංශ අනුව ලියාපදංචි කර ඇත.

## 2009 සිට 2013 දක්වා පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා සභාව මඟින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සටහන

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සංඛ්‍යාව | 65 | 27 | 26 | 20 | 29 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 865 | 450 | 404 | 386 | 461 |
| වාර්ෂිකව සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 600 | 315 | 315 | 290 | 355 |
| සම්මුඛ පරීක්ෂණ මඟින් ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලැබූ අයැදුම්කරුවන් සංඛ්‍යාව | 287 | 140 | 85 | 136 | 182 |
| **සහභාගී වූ අයැදුම්කරුවන්ගෙන් සමත් වීමේ ප්‍රතිශතය** | **47.83%** | **44.44%** | **26.98%** | **46.89%** | **51.28%** |



## 2009 සිට 2013 දක්වා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2009 ලියාපදිංචි සංඛ්‍යාව | 2010 ලියාපදිංචි සංඛ්‍යාව | 2011 ලියාපදිංචි සංඛ්‍යාව | 2012 ලියාපදිංචි සංඛ්‍යාව | 2013 ලියාපදිංචි සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | | | | | |
| **උපාධිධාරීන්** | 190 | 161 | 162 | 135 | 137 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 63 | 85 | 78 | 80 | 67 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය | 82 | 39 | 61 | 25 | 47 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 28 | 24 | 20 | 19 | 17 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - යාපනය විශ්ව විද්‍යාලය | 12 | 13 | 03 | 11 | 06 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - ඉන්දියාව | 05 | - | - | - | - |
| **ඩිප්ලෝමාධාරීන්** | 72 | 91 | 89 | 95 | 76 |
| ඩී.ඒ.එම්.එස් - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 01 | - | - | - | - |
| සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 01 | - | - | - | - |
| ආයුර්වේද ශාස්ත්‍රී | 62 | 90 | 77 | 84 | 72 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 08 | 01 | 12 | 11 | 04 |
| **පාරම්පරික - සර්වාංග** | 48 | 75 | 30 | 45 | 45 |
| පාරම්පරික | 48 | 75 | 30 | 45 | 45 |
| **පාරම්පරික - විශේෂ** | 165 | 148 | 68 | 85 | 90 |
| සර්ප විෂ | 62 | 38 | 29 | 27 | 26 |
| කැඩුම් බිඳුම් | 78 | 72 | 30 | 44 | 47 |
| අක්ෂි රෝග | 02 | 04 | 02 | 01 | 01 |
| චර්ම රෝග | 06 | 09 | 02 | 01 | 07 |
| ගෙඩිවණ | 08 | 10 | 01 | 05 | 04 |
| ජලභීතිකා | 01 | 01 | - | - | 01 |
| දූවුම් පිලිස්සුම් | 04 | 05 | 01 | 02 | 02 |
| මානසික | 04 | 09 | 03 | 05 | 02 |
| **මුළු එකතුව ( සර්වාංග / විශේෂ )** | 475 | 475 | 349 | 360 | 348 |

## 2013.12.31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව

| අයිතමය | 2013.12.31 දින වන විට ලියාපදිංචි මුළු සංඛ්‍යාව |
|---|---|
| **සාමාන්‍ය (සර්වාංග)** | |
| **උපාධිධාරීන්** | 2246 |
| එල්.ඒ.එම්.එස්. - කල්කටා | 52 |
| එෆ්.එම්.බී.එස්. - අලහමාබාද් | 04 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 1123 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කැළණිය විශ්ව විද්‍යාලය | 382 |
| යුනානි වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - කොළඹ විශ්ව විද්‍යාලය | 334 |
| සිද්ධ වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - යාපනය විශ්ව විද්‍යාලය | 346 |
| ආයුර්වේද වෛද්‍ය හා ශල්‍යවේදී උපාධිය - ඉන්දියාව | 05 |
| **ඩිප්ලෝමාධාරීන්** | 5100 |
| ඩී.අයි.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 482 |
| ඩී.ඒ.එම්.එස්. - දේශීය වෛද්‍ය විද්‍යායතනය, කොළඹ | 1262 |
| ඩී.එස්.ඒ.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 1166 |
| ඩී.ඒ.එස්.සී. - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 173 |
| එල්.ඒ.එම්. - යාපනය සිද්ධ විද්‍යාලය | 56 |
| සිද්ධායුර්වේදඥලාභීන් - ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යායතනය | 568 |
| ආයුර්වේද ශාස්ත්‍රී | 1289 |
| යාපනය සිද්ධ විද්‍යාලයේ අවසාන වසර සමත් | 104 |
| **පාරම්පරික - සර්වාංග** | 5385 |
| පාරම්පරික | 5385 |
| **පාරම්පරික - විශේෂ** | 8329 |
| සර්ප විෂ | 3494 |
| කැඩුම් බිඳුම් | 2229 |
| අක්ෂි රෝග | 627 |
| චර්ම රෝග | 536 |
| ගෙඩිවණ | 364 |
| ජලභීතිකා | 181 |
| දැවුම් පිළිස්සුම් | 82 |
| මානසික | 151 |
| විදුම් පිළිස්සුම් | 07 |
| වෙනත් | 658 |
| **එකතුව ( සර්වාංග / විශේෂ )** | 21060 |
| **තොරතුරු සොයා ගත නොහැකි** | 2554 |
| **මුළු එකතුව (සර්වාංග / විශේෂ / මියගොස් ඇති වෛද්‍යවරුන්)** | 23614 |
| **මියගොස් ඇති සංඛ්‍යාව** | 2813 |

## 06. ආයුර්වේද සාත්තු සේවකයින් හා හෙෂජ්‍යකවරුන් ලියාපදිංචි කිරීම

ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් සාත්තු සේවකයින් වශයෙන් පුහුණු කිරීමට බඳවාගෙන ඇති අයැදුම්කරුවන් 30 **දෙනෙකු** ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අයැදුම්පත් ඉදිරිපත් කර ඇත. මොවුන් අවසාන විභාගය සමත් සහතික පත්‍රය ඉදිරිපත් කර නොමැති බැවින් ලියාපදිංචි සහතික නිකුත් කිරීම මෙතෙක් සිදු කර නොමැත.

කැළණිය විශ්ව විද්‍යාලයේ ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය **මඟින්** හෙෂජ්‍යයක පාඨමාලාව අවසන් කළ හෙෂජ්‍යයකවරුන් 23 දෙනා අතුරින් 2012 වර්ෂය අවසන් වන විට 18 දෙනකු ලියාපදිංචිය ලබා ගැනීම සඳහා අයැදුම්පත් භාර දී තිබූ අතර අනෙකුත් අයදුම්කරුවන් 05 දෙනා 2013 වර්ෂයේ අයදුම්පත් භාරදෙන ලදී. ඔවුන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කර ඇත.

**තවද ආයුර්වේද සාත්තු සේවකයින් සඳහා පුහුණුව ලබා දුන් ආයතනයෙන් සහතිකයක් ලබා නොදීම හේතුවෙන් වර්ෂ 2012, 2013 වර්ෂවලදී ආයුර්වේද වෛද්‍ය සභාවට ලියාපදිංචි වීම සඳහා අයදුම් කල ආයුර්වේද සාත්තු සේවකයින් ලියාපදිංචි කිරීමට නොහැකි වී ඇත.**

| අයිතමය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | අයැදුම්පත් සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව | අයැදුම්පත් සංඛ්‍යාව | ලියාපදිංචි කර ඇති සංඛ්‍යාව |
| ආයුර්වේද සාත්තු සේවකයින් - හෙද නිලධාරීන් | 19 | -- | 11 | -- |
| හෙෂජ්‍යයකවරුන් | 62 | 44 | 05 | 23 |

## 07. "හෙළ වෙද රුවනාර"



මහින්ද චින්තන ජාතික වැඩ පිළිවෙල යටතේ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන "හෙළ වෙද පුනරුද" වැඩ සටහනට සමගාමීව ආයුර්වේද වෛද්‍ය සභාවේ මෙහෙයවීමෙන් " හෙළවෙද රුවනාර" වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදී.

ඒ යටතේ,

1. ආයුර්වේද වෛද්‍ය සභාවේ ජංගම සේවා කවුළුවක් මඟින් පහත සඳහන් කටයුතු ඉටු කිරීම.
    - පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචියට අවශ්‍ය අයැදුම්පත් නිකුත් කිරීම
    - පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචියට අදාළ අයැදුම්පත් භාර ගැනීම
    - ලියාපදිංචිය සඳහා එවන ලද අයැදුම්පත් වල අඩුපාඩු සැකසීම
    - ලියාපදිංචි අපේක්ෂිතයින්ගේ ගැටළු විසඳීම
    - ආයුර්වේද වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම
    - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන ලාංඡන නිකුත් කිරීම.
    - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.
    - ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන්ගේ තොරතුරු යාවත් කාලීන කිරීම

2. පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.
3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෘත්තය සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම
4. හෙළවෙද රැකවරණ විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක නොවූ වෛද්‍යවරුන් ඒ සඳහා දායක කර ගැනීම සිදු කරන ලදී.
5. වෘත්තය සංවර්ධනය සඳහා වන දේශන මාලා පැවැත්වීම.

## 2009 සිට 2013 දක්වා පැවැත් වූ "හෙළවෙද රුවනාර" වැඩසටහන් පිළිබඳ වාර්තාව

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| වාර්ෂිකව පවත්වන ලද වෘත්තිය සංවර්ධන වැඩ සටහන් සංඛ්‍යාව - හෙළවෙද රුවනාර | 03 | 03 | 04 | 04 | 02 |
| සහභාගිත්වය | 898 | 832 | 1233 | 1225 | 627 |
| **එක් වැඩ සටහනක් සඳහා සහභාගිත්වයේ සාමාන්‍ය** | **300** | **277** | **308** | **306** | **313** |

| **දිනය** | **ස්ථානය** | **සහභාගිත්වය** |
|---|---|---|
| 2013.03.24 | අම්පාර ආයුර්වේද රෝහල් ශ්‍රවණාගාරය | 59 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 38 |
| 2013.06.28 | රත්නපුර පළාත් සභා ශ්‍රවණාගාරය | 568 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 260 |




## 08. "උතුරු වෙද වරුණ"

අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ "උතුරු වසන්තය" වැඩ පිළිවෙලට සමගාමීව දේශිය වෛද්‍ය අමාත්‍යාංශය **සැලසුම්** කර ඇති සංවර්ධන වැඩසටහන වඩාත් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ මෙහෙයවීමෙන් "උතුරු වෙද වරුණ" වැඩ සටහන යාපනය දිස්ත්‍රික්කය **ආවරණය** වන පරිදි ක්‍රියාත්මක කරන ලදී.

| **දිනය** | **ස්ථානය** | **සහභාගිත්වය** |
|---|---|---|
| 2013.06.12 | නිර්වේලි, පොන් සෙල්ව මහල් ශ්‍රවණාගාරය | 150 |
| | ස්වර්ණ මුද්‍රිකා ලාභී වෛද්‍යවරු සංඛ්‍යාව | 28 |

## 09. ආයුර්වේද වෛද්‍ය සභාවේ නිල වෙබ් අඩවිය

රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ ආයුර්වේද වෛද්‍යවරුන් සම්බන්ධ විශේෂ අවධානය යොමු වී ඇති මෙම කාලසීමාවේ එම කටයුතු පහසු කිරීම සඳහා සහ ආයුර්වේද ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා හා ලියාපදිංචි හා ලියාපදිංචි අපේක්ෂිත ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා අවශ්‍යවන මාර්ගෝපදේශ, නීති රෙගුලාසි හා අනෙකුත් නෛතික තත්තවයන් රාජ්‍ය අංශයේ මෙන්ම ව්‍යාපාරික අංශයේ ප්‍රජාවගේ අවශ්‍යතාවය අනුව එළිදැක්වීම මෙම වෙබ් අඩවියෙන් අපේක්ෂා කෙරේ. යාවත් කාලීන සියළු වෛද්‍යවරුන්ගෙ තොරතුරු www.ayurvedicmedicoun.gov.lk නිල වෙබ් අඩවිය හරහා අන්තර්ජාලයට **එක් කර** ඇත.




## 10. 2013 වර්ෂය තුළ ආයුර්වේද වෛද්‍ය සභාව මඟින් ගනු ලැබූ හා ගෙන තිබූ තීරණවලට අනුගතව ක්‍රියාත්මක කරනු ලැබූ වෙනත් කටයුතු

1. 1961 අංක 31 දරණ ආයුර්වේද පනතේ 81 වගන්තිය ප්‍රකාරව උප්පැන්න මරණ රෙජිස්ටාර්වරුන් විසින් මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් ලියාපදිංචි නාමලේඛනයෙන් ඉවත් කිරීම.

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| මියගොස් ඇති බව දන්වා එවා ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 08 | 27 | 27 | 19 | 100 |

2. රජයේ හා පෞද්ගලික ආයතන වල සේවයේ නියුතු නිලධාරීන් සඳහා ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ලබා දෙනු ලැබූ වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදුකිරීම.

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව | 392 | 355 | 250 | 222 | 280 |

එක් එක් රාජ්‍ය ආයතන වල විගණන විමර්ශන වලින් සපයා ඇති දත්ත අනුව සාවද්‍ය වෛද්‍ය සහතික නිකුත් කරන සැක සහිත වෛද්‍යවරුන් වෙත දින 14 ක් ඇතුළත ආයුර්වේද වෛද්‍ය සභාවට පැමිණ කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වා ලිපි යොමු කරනු ලැබේ. ඒ සඳහා ප්‍රතිචාර නොදක් වූ වෛද්‍යවරුන් විසින් නිකුත් කරන වෛද්‍ය සහතික පිළිනොගැනීමට කටයුතු කර ඒ බව අදාළ ආයතන දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමගින් සාවද්‍ය ලෙස නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික අවම කර ගැනීමට හැකි වී ඇත.

3. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | 541 | 109 | 671 | 495 |

4. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වාහන නිල ලාංජන නිකුත් කිරීම.

| අයිතමය | 2012 | 2013 |
|---|---|---|
| වාහන නිල ලාංජන නිකුත් කිරීම | 335 | 161 |

5. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සහයෝගය ඇතිව නවක ලියාපදිංචි වෛද්‍යවරුන් සඳහා මූලික වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| සහභාගිත්වය | 107 | 117 | 126 | 276 | 136 |

6. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා වෛද්‍ය සහතික පොත් නිකුත් කිරීම.

| අයිතමය | 2009 | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|---|
| නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව | 865 | 1517 | 1181 | 1256 | 840 |

7. ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා ජාත්‍යන්තර සහතික නිකුත් කිරීම.

| අයිතමය | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| නිකුත් කළ ජාත්‍යන්තර සහතික සංඛ්‍යාව | 09 | 14 | 12 | 13 |

8. දේශීය හස්ති වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම ආරම්භ කළ අතර ඒ අනුව පළමුව ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ අයදුම්කරුවන් 05 දෙනකු ලියාපදිංචි කිරීමට අදාළ සම්මුඛ පරීක්ෂණ 2013.11.28 දින

පවත් වන ලදී. එම සම්මුඛ පරීක්ෂණයෙන් ඔවුන් 5 දෙනා සමත් වී ඇති බැවින් ඉදිරියේ දී ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරණු ඇත.

| අයිතමය | 2013 |
|---|---|
| දේශීය හස්ති වෛද්‍යවරුන් සංඛ්‍යාව | 05 |

ඉහත කරුණු අනුව ආයුර්වේද වෛද්‍ය සභාව 2013 වර්ෂය තුළ එහි පරමාර්ථ ඉටුවන අයුරින් කටයුතු කර ඇති බව සඳහන් කිරීමට කැමැත්තෙමි. වෛද්‍ය සභාවේ පාලනයෙන් තොර හේතු මත ආයුර්වේද සාත්තු සේවකයින් ලියාපදිංචි කිරීම හා ආයුර්වේදය උගන්වන ආයතන ලියාපදිංචි කිරීම වැනි අනෙකුත් අරමුණු ඉටු කිරීමට නොහැකි වූ බවත් එම අරමුණු 2014 වර්ෂයේ දී ඉටු කර ගැනීමට හැකි ලෙස මූලික කටයුතු ආරම්භ කර ඇති බවත් සඳහන් කරමි.

**පී. එස්. කේ. ආර්. වීරකෝන්**
**ආයුර්වේද කොමසාරිස් සහ**
**ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති**



2014.07.09 දින

මහරගම,
නාවින්න,
පරණ කොට්ටාව පාරේ,
ආයුර්වේද වෛද්‍ය සභා කාර්යාලයේ දී.

# ආයුර්වේද වෛද්‍ය සභාව

## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විස්තරය | 2013.12.31 | 2012.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| 01. අයභාරය - රජයේ ප්‍රතිපාදන | 5,000,000.00 | 4,700,000.00 |
| 02.වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ ගාස්තු - සටහන් 01 | 4,015,550.00 | 2,152,637.00 |
| 03.වෙනත් ආදායම් - සටහන් 02 | 408,224.00 | 208,732.00 |
| | | |
| 04. මුළු ආදායම ( 01 + 02 +03 ) | 9,423,774.00 | 7,061,369.00 |
| | | |
| 05.සාමාන්‍ය පොදු වියදම් - සටහන් 03 | 6,969,126.00 | 6,067,057.00 |
| 06.මූල්‍ය වියදම් - සටහන් 04 | 69,651.00 | 70,482.00 |
| 07.වෙනත් වියදම් - සටහන් 05 | 809,727.00 | 1,020,650.00 |
| | | |
| 08. මුළු වියදම ( 05 + 06 + 07) | 7,848,504.00 | 7,158,189.00 |
| 09. වාර්ෂික ඌණතාවය / අතිරික්තය ( 04 - 08 ) | 1,575,270.00 | (96,820.00) |

**ඉහත සකස් කරන ලද ගිණුම් කරන ප්‍රකාශණය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.**

වෛද්‍ය ආර්.එල්.රණසිංහ
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

පී.එස්.කේ.ආර්.වීරකෝන්
සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව

සකස් කලේ -
**දමිත් කළුආරච්චි**
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

සටහන් 01

| විස්තරය | 2013.12.31 | 2012.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| ලියාපදිංචි ගාස්තු | 1,529,250.00 | 690,000.00 |
| සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 294,260.00 | 158,400.00 |
| ලියාපදිංචි ඉල්ලුම්පත්‍ර ගාස්තු | 842,285.00 | 365,530.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 310,700.00 | 146,125.00 |
| වාහන ලාංජන නිකුත් කිරීමේ ගාස්තු | 81,400.00 | 166,000.00 |
| සහතික පිටපත් ගාස්තු | 24,000.00 | 27,750.00 |
| තැපැල් ආදායම් | 67,345.00 | 78,355.00 |
| වෛද්‍ය සහතික පොත් ගාස්තු | 311,400.00 | 251,200.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 406,500.00 | 196,250.00 |
| නම් වෙනස් කිරීමේ ගාස්තු | 15,500.00 | 3,500.00 |
| නාමලේඛන පිටපත් ගාස්තු | 26,410.00 | 4,277.00 |
| අතිරේක සුදුසුකම් ඇතුළත් කිරීමේ ගාස්තු | 11,500.00 | 5,250.00 |
| ජාත්‍යන්තර සහතික පිටපත් ගාස්තු | 95,000.00 | 60,000.00 |
| | 4,015,550.00 | 2,152,637.00 |

සටහන් 02

| විස්තරය | 2013.12.31 | 2012.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| සේවක ණය පොළී | 49,924.00 | 39,428.00 |
| පාරිතෝෂික ආයෝජන පොළිය | 150,465.00 | 71,631.00 |
| විවිධ ආදායම් | 207,835.00 | 97,673.00 |
| | 408,224.00 | 208,732.00 |

සටහන් 03

| විස්තරය | 2013.12.31 | 2012.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| කාර්ය මණ්ඩල වැටුප් | 3,400,346.00 | 3,025,024.00 |
| දිරි දීමනා | 331,950.00 | |
| සේවක අර්ථ සාධක අරමුදල | 373,842.00 | 310,152.00 |
| සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 93,460.00 | 77,538.00 |
| වෛද්‍ය හැඳුනුම්පත් ගාස්තු | 52,958.00 | 88,084.00 |
| ලිපිද්‍රව්‍ය වියදම් | 137,572.00 | 218,693.00 |
| සම්මුඛ පරීක්ෂණ මණ්ඩල ගාස්තු | 283,500.00 | 175,980.00 |
| වෛද්‍ය සභා රැස්වීම් ගාස්තු | 508,000.00 | 543,600.00 |
| අතිකාල වියදම් | 273,144.00 | 322,565.00 |
| දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර | 42,270.00 | 54,090.00 |
| අනු කමිටු දීමනා | 59,200.00 | 50,000.00 |
| දුරකතන ගාස්තු | 77,531.00 | 71,279.00 |
| දුම්රිය බලපත්‍ර ගාස්තු | 19,825.00 | 17,110.00 |
| පාරිතෝෂික දීමනා | 255,267.00 | 214,429.00 |
| මුද්‍රණ ගාස්තු | 254,687.00 | 208,066.00 |
| දැන්වීම් ගාස්තු | 82,880.00 | 163,341.00 |
| ලිඛිත පරීක්ෂණ ගාස්තු | 253,675.00 | 148,618.00 |
| කුලිරථ ගාස්තු | 235,700.00 | 231,558.00 |
| සේවක පුහුණු ගාස්තු | 106,350.00 | 22,500.00 |
| විදුලි ගාස්තු | 126,969.00 | 124,430.00 |
| | 6,969,126.00 | 6,067,057.00 |

සටහන් 04

| විස්තරය | 2013.12.31 | 2012.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විගණන ගාස්තු | 60,000.00 | 60,000.00 |
| රක්ෂණ ගාස්තු | 9,651.00 | 10,482.00 |
| | 69,651.00 | 70,482.00 |

සටහන් 05

| විස්තරය | 2013.12.31 | 2012.12.31 |
|---|---|---|
| | රුපියල් | රුපියල් |
| විවිධ වියදම් | 95,755.00 | 140,076.00 |
| ගමන් වියදම් | 33,849.00 | 84,174.00 |
| තැපැල් ගාස්තු | 141,455.00 | 119,875.00 |
| සංග්‍රහ වියදම් | 121,723.00 | 197,368.00 |
| පුවත්පත් ගාස්තු | 27,560.00 | 22,790.00 |
| කාර්යාල උපකරණ අළුත්වැඩියා | 98,798.00 | 108,089.00 |
| වාර්ෂික ක්ෂය කිරීම | 290,587.00 | 307,423.00 |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | | 40,855.00 |
| | 809,727.00 | 1,020,650.00 |

# ආයුර්වේද වෛද්‍ය සභාව

## 2013.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2013.12.31 රුපියල් | | 2012.12.31 රුපියල් | |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| මුදල් ශේෂය | 234,523.00 | | 22,108.00 | |
| කාර්යමණ්ඩල ණය | 1,314,914.00 | | 837,600.00 | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | 480,000.00 | | | |
| ලිපිද්‍රව්‍ය තොගය | 274,938.00 | | 175,650.00 | |
| තැපැල් මුද්දර තොගය | 138,670.00 | | 30,125.00 | |
| ඉදිරියට ගෙවන ලද කාර් උපකරණ | 10,812.00 | | | |
| | | 2,453,857.00 | | 1,065,483.00 |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, පිරියත හා උපකරණ ( ගත්මිල ) | 4,121,902.00 | | 3,923,942.00 | |
| සමුච්චිත ක්ෂය | 2,647,330.00 | | 2,356,744.00 | |
| දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ අගය) | | **1,474,572.00** | | **1,567,198.00** |
| **වෙනත් මූල්‍ය නොවන වත්කම්** | | | | |
| පාරිතෝෂික දීමනා ආයෝජන | | **1,423,470.00** | | **1,168,203.00** |
| **මුළු වත්කම්** | | **5,351,899.00** | | **3,800,884.00** |
| **බැරකම්** | | | | |
| **ජංගම බැරකම්** | | | | |
| විගණන ගාස්තු | 120,000.00 | | 62,208.00 | |
| දුරකතන ගාස්තු | 8,015.00 | | 4,716.00 | |
| පුවත්පත් ගාස්තු | 2,380.00 | | 2,480.00 | |
| අතිකාල දීමනා | 10,870.00 | | 15,096.00 | |
| විවිධ වියදම් | 2,399.00 | | | |
| ඉදිරි වර්ෂය සඳහා ලියාපදිංචි ගාස්තු | 21,500.00 | | 53,000.00 | |
| දැන්වීම් ගාස්තු | | | 78,400.00 | |
| විදුලි ගාස්තු | 10,103.00 | | 8,064.00 | |
| කාර්ය මණ්ඩල වැටුප් | 1,069.00 | | 9,000.00 | |
| දිරි දීමනා | 19,800.00 | | | |
| දුම්රිය බලපත්‍ර | 7,465.00 | | 6,380.00 | |
| | | 203,601.00 | | 239,344.00 |
| **ජංගම නොවන බැරකම්** | | | | |
| පාරිතෝෂික දීමනා වෙන්කිරීම | | **1,423,470.00** | | **1,168,203.00** |

| | | | | |
|---|---|---|---|---|
| මුළු බැරකම් | | 1,627,071.00 | | 1,407,547.00 |
| ශුද්ධ වත්කම් | | 3,724,828.00 | | 2,393,337.00 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | | |
| ප්‍රාග්ධනය හා සංචිතය | 2,385,073.00 | | 2,449,302.00 | |
| සමුච්චිත උණතාවය / අතිරික්තය | 1,575,270.00 | | (96,820.00) | |
| | 3,960,343.00 | | 2,352,482.00 | |
| අඩු කළා / එකතු කළා | | | | |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | 235,515.00 | - | 40,855.00 | - |
| මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය | | 3,724,828.00 | | 2,393,337.00 |

**ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශනය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.**

සකස් කළේ

වෛද්‍ය, ආර්.එල්.රණසිංහ
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

පී.එස්.කේ.ආර්.වීරකෝන්
සභාපති,
ආයුර්වේද වෛද්‍ය සභාව

**දමිත් කළුආරච්චි**
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

## ආයුර්වේද වෛද්‍ය සභාව ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම

**ගිණුම් ඉදිරිපත් කිරීම** - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුව ගිණුම් සකස් කර ඇත.

**ක්ෂය ක්‍රමය** - සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගගෙනය

**ක්ෂය අනුපාතය** -

ලී හා වානේ වලින් සැදුම්ලත් වත්කම් 12%

විදුලියෙන් හෝ බැටරියෙන් ක්‍රියාකරන වත්කම් 22%

1. වත්කම් වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්ත ද එම අදාළ සම්පූර්ණ වර්ෂය සදහාම ක්ෂය ගණන් බලනු ලැබේ
2. වත්කම් වර්ෂයේ කුමන දිනයක ඉවත් කළද එම ඉවත් කළ සම්පූර්ණ වර්ෂය සදහාම ක්ෂය ගණන් බලනු නොලැබේ

**පාරිතෝෂික දීමනා** -

1. වසර පහක ස්ථිර සේවයේ සිටින නිලධාරීන් සඳහා පාරිතෝෂික දීමනා වෙන් කිරීම සිදු කරනු ලැබේ.
2. එක් එක් නිලධාරියා දෙසැම්බර් මස ලබන දළ වැටුපෙන් අඩක් ( භාගයක් ) එම නිලධාරියාගේ එක් සේවා වර්ෂයක් වෙනුවෙන් වෙන් කරනු ලැබේ.
3. එම වාර්ෂික ප්‍රතිපාදනය එක් එක් සේවකයාගේ සේවා කාලය හා ගලපා සම්පූර්ණ පාරිතෝෂිකය ගණනය කරනු ලැබේ.
3. එම වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ජාතික අයවැය දෙපාර්තමේන්තුව ලබා දී ඇති අනුමැතිය මත ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු ගිණුමක ආයෝජනය කරනු ලැබේ.

**පෙරවර්ෂ ගැලපුම් ගිණුම**

2012 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1.හි සඳහන් ගිණුම්කරණ අඩුපාඩුව නිවැරදි කිරීමට අදාළ ගැලපුම මෙම පෙරවර්ෂ ගිණුම මඟින් සිදු කර ඇත.

සකස් කළේ
**දමිත් කළුආරච්චි**
කළමනාකරණ සහකාර
ආයුර්වේද වෛද්‍ය සභාව

# ආයුර්වේද වෛද්‍ය සභාව

## 201312.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 වර්ෂය | | | 2012 වර්ෂය | | |
|---|---|---|---|---|---|---|
| | අඩුවීම | එකතුවීම | | අඩුවීම | එකතුවීම | |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ආදායම** | | | | | | |
| පොලී ආදායමට පෙර අතිරික්තය | | | **1,575,270.00** | | | **(96,820.00)** |
| මුදල් චලනය කෙරෙහි බල නොපාන විෂයන් ගැලපීම | | | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | 49,924.00 | | | | | |
| පාරිතෝෂික ආයෝජන පොලිය | 150,465.00 | | | 39,428.00 | | |
| වාර්ෂික ක්ෂය | | 290,587.00 | | 71,631.00 | | |
| සංචිත වෙනස්වීම | 8,265.00 | | | | 307,423.00 | |
| පෙරවර්ෂ ගැලපුම් ගිණුම | 235,515.00 | | | | 40,855.00 | |
| විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 255,267.00 | | | 214,429.00 | |
| | 444,169.00 | 545,854.00 | **101,685.00** | 111,059.00 | 562,707.00 | **451,648.00** |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීමම් වලට පෙර මෙහෙයුම් අතිරික්තය** | | | **1,676,955.00** | | | **354,828.00** |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ වෙනස්වීම.** | | | | | | |
| ණය ගැතියෝ | 477,314.00 | | | | 48,728.00 | |
| තොගය ( ලිපිද්‍රව්‍ය ) | 99,288.00 | | | | 23,283.00 | |
| තැපැල් මුද්දර තොගය | 108,545.00 | | | 30,125.00 | | |
| වෛද්‍ය සහතික පොත් තොග ගිණුම | 480,000.00 | | | | | |
| විගණන ගාස්තු | | 57,792.00 | | | 2,208.00 | |
| උපචිත දුරකතන ගාස්තු | | 3,299.00 | | | 1,594.00 | |
| උපචිත විවිධ වියදම් | | 2,399.00 | | | | |
| ඉදිරි වර්ෂය සඳහා ගෙවීම් කාර්. උපකරණ | 10,812.00 | | | | | |
| උපචිත පුවත්පත් ගාස්තු | 100.00 | | | | 220.00 | |
| උපචිත අතිකාල ගාස්තු | 4,226.00 | | | 16,236.00 | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උපචිත දුම්රිය බලපත්‍ර ගාස්තු | | 1,085.00 | | | 5,140.00 | |
| උපචිත ලිඛිත පරීක්ෂණ ගාස්තු | | | | 1,625.00 | | |
| උපචිත දිරි දීමනා | | 19,800.00 | | | | |
| උපචිත කාර්යමණ්ඩල වැටුප් | 7,931.00 | | | 33,971.00 | | |
| උපචිත හැඳුනුම්පත් ගාස්තු | | | | 13,000.00 | | |
| ඉදිරිවර්ෂය සඳහා ලි.ප.ගාස්තු | 31,500.00 | | | | 43,000.00 | |
| උපචිත විදුලි ගාස්තු | | 2,039.00 | | 1,936.00 | | |
| දැන්වීම් ගාස්තු | 78,400.00 | | | | 78,400.00 | |
| | 1,298,116.00 | 86,414.00 | (1,211,702.00) | 96,893.00 | 202,573.00 | 105,680.00 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | **465,253.00** | | | **460,508.00** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | 197,960.00 | | | 414,504.00 | | |
| පාරිතෝෂික ආයෝජන පොළිය | | 150,465.00 | | | 71,631.00 | |
| පාරිතෝෂික දීමනා | 255,267.00 | | | 214,429.00 | | |
| | 453,227.00 | 150,465.00 | **(302,762.00)** | 628,933.00 | 71,631.00 | **(557,302.00)** |
| **මුදල් හා සමාන විෂයන්ගේ අඩුවීම** | | | **162,491.00** | | | **(96,794.00)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | | | | | |
| කාර්ය මණ්ඩල ණය පොලී | | | **49,924.00** | | | **39,428.00** |
| | | | **212,415.00** | | | **(57,366.00)** |
| වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන් | | | | | | |
| බැංකු ගිණුම | | | **22,108.00** | | | **79,474.00** |
| වර්ෂය අවසානයේ ශුද්ධ මුදල් ප්‍රවාහය | | | **234,523.00** | | | **22,108.00** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන විෂයන්** | | | | | | |
| බැංකු ගිණුම | | | **234,523.00** | | | **22,108.00** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන විෂයන්ගේ අඩුවීම** | | | **234,523.00** | | | **22,108.00** |

**ඉහත සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රකාශනය නිවැරදිව හා ඊට අදාල ගිණුම් තැබීම නිවැරදිව සිදු කර ඇති බව සහතික කරමි.**

**සකස් කළේ :-** **දමිත් කළුආරච්චි**

**කළමනාකරණ සහකාර - ආයුර්වේද වෛද්‍ය සභාව**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්එම්/සී/ඒඑම්සී 1/13/20

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2014 නොවැම්බර් 21 දින

සභාපති,

ආයුර්වේද වෛද්‍ය සභාව.

**ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යයසාධන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 3 කොටසෙහි 11-21 දක්වා වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල්පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් වෛද්‍ය සභාවේ සභාපති වෙත 2013 අප්‍රේල් 08 දින නිකුත් කරන ලදී.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරි වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද වෛද්‍ය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 111 වනකොටස් 11(1)(ඉ) වගන්තිය. | ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් තෝරා පත් කරනු ලැබූ සමාජිකයින් 3 දෙනෙකු සභාවේ සංයුතියට ඇතුළත් විය යුතු වුවද, වෛද්‍ය සභාවට ලියාපදිංචි වෛද්‍යවරුන් කිසිවකු පත් කර නොතිබුණි. මේ පිළිබඳ ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තා මඟින් ද පෙන්වා දී තිබුණි. |
| (ආ) | 2005 ජුලි 05 දිනැතිඅංක 14/13/08 (3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව | 2006 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වර්ෂ 05 කට වරක් ලියාපදිංචි වූ වෛද්‍යවරුන්ගෙන් ලියාපදිංචි ගාස්තුවක් අය කර ලියාපදිංචිය යාවත්කාලීන කිරීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය I XII වන පරිච්ඡේදයේ 36 වගන්තිය | නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.132,200 ක ආපදා ණය සහ රු. 1,000 ක උත්සව අත්තිකාරම් අය කර ගැනීමකින් තොරව, වර්ෂ 3ක් සඳහා වැටුප් රහිත විදේශ අනුමත කර විදේශ නිවාඩු කර විදේශ ගත වී තිබුණි. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 169 | නිශ්කාෂණය නොවූ රු.8,745 ක් වටිනා මුදල් ඇණවුම් 25ක මුල්පිට පත් කාර්යාලයේ නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | DMS/E3/38/4/241/1-(vol)1 අංක දරන 2013 ජුනි 04 අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ දිනැති මුදල් හා ක්‍රම සම්පාදන ලිපිය | වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකුට මසයකට රු.1,800ක උපරිමයකට යටත්ව දිරිදීමනා ගෙවීම අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී එම සීමාව ඉක්මවා නිලධාරීන් 11ක් වෙනුවෙන් රු.112,300 ක දිරි දීමනා ගෙවා තිබුණි. වාර්ෂික අයවැය ලේඛණය මගින් දිරිදීමනා ගෙවීමට මුදල් වෙන් කර නොතිබුණි. |

3. **මූල්‍ය සමාලෝචනය**

---------------------

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

------------

සමාලෝචිත වර්ෂය තුළදී සභාවේ කටයුතුවල මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,575,270 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.96,820 ක් විය. මුළු ආදායම ඉකුත් වර්ෂයේ ආදායමට වඩා සියයට 33 ක් හෙවත් රු.2,362,405 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ ඉහල යාම කෙරෙහි විශේෂයෙන් බලපා තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

4.1 **කාර්යසාධනය**

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලියාපදිංචිය යාවත්කාලීන කර නොමැති වෛද්‍යවරුන් මේ වන විට ජීවත්ව සිටින්නේද යන්න පිළිබඳව තහවුරුකර ගැනීමේ ක්‍රමවේදයක් නොමැති බැවින් ආයුර්වේද වෛද්‍යවරයෙකුට සමාජයේ පවතින විශ්වාසනීයතාවය යොදාගනිමින් හා ඔවුන්ගේ ලියාපදිංචි අංක භාවිතා කරමින් වංචාකාරී පුද්ගලයන්ට වෛද්‍ය වෘත්තියේ යෙදිය හැකිවීම, වෛද්‍ය සහතික නිකුත් කිරීම වැනි විවිධ දූෂණ ක්‍රියා සිදු නොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) පහත සඳහන් අනුකමිටු 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ක්‍රියාත්මක නොවූ බැවින් මෙම අනු කමිටු වලින් අපේක්ෂිත කාර්යය ඉටු වී නොතිබුණි.

i. පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීමේ විෂය නිර්දේශය සංශෝධනය කිරීමේ අනු කමිටුව.

ii. අභාවයට යන පාරම්පරික විදුම් පිළිස්සුම් වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීමේ අනු කමිටුව.

iii. පශු වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම පිළිබඳ අනුකමිටුව.

iv. දේශීය පාරම්පාරික දැනුමට අදාළ දත්ත මූලාශ්‍ර පිහිටුවීමේ කමිටුව.

v. දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘත්තීය සංවර්ධන අනුකමිටුව

(ඇ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ දෙකක ලියාපදිංචි වෛද්‍යවරුන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව. | | |
|---|---|---|---|
| | 2013 දෙසැම්බර් 31 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට | 2011 දෙසැම්බර් 31 දිනට |
| **සර්වාංග** | | | |
| උපාධිධාරී | 2,190 | 2,109 | 1974 |
| ඩිප්ලෝමාධාරී | 5,156 | 5,024 | 4929 |
| පාරම්පරික | 5,385 | 5,340 | 5295 |
| **පාරම්පරික විශේෂ** | | | |
| සර්ප විෂ | 3,494 | 3,469 | 3442 |
| කැඩුම් බිඳුම් | 2,229 | 2,182 | 2138 |
| අක්ෂි රෝග | 627 | 626 | 625 |
| චර්ම රෝග | 536 | 529 | 528 |
| ගෙඩි වණ | 364 | 360 | 355 |
| ජලභීතිකා | 181 | 180 | 180 |
| දැවුම් පිළිස්සුම් | 82 | 80 | 78 |
| මානසික | 151 | 149 | 144 |

| | | | |
|---|---|---|---|
| විදුම් පිළිස්සුම් | 07 | 07 | 07 |
| වෙනත් | 658 | 658 | 658 |
| | -------- | -------- | -------- |
| එකතුව | 21,060 | 20,713 | 20,353 |

අක්ෂි රෝග, චර්ම රෝග, ගෙඩිවණ, දැවුම් පිළිස්සුම්, ජලභීතිකා හා මානසික යන පාරම්පරික විශේෂ වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වැඩිවී තිබුණේ 17 කින් වන අතර, විදුම් පිළිස්සුම් සහ වෙනත් පාරම්පරික විශේෂ වෛද්‍යවරුන් ලියාපදිංචි වීමක් 2010 වර්ෂයෙන් පසු සිදු වී නොතිබුණි.

(ඈ) පසුගිය වසර පහක එක් එක් වර්ෂයේ වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම පහත දැක්වේ.

| වෛද්‍යවරුන් | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|
| උපාධිධාරී | 137 | 135 | 162 | 161 | 190 |
| ඩිප්ලෝමාධාරී | 76 | 95 | 89 | 91 | 72 |
| පාරම්පරික | 45 | 45 | 30 | 75 | 48 |
| පාරම්පරික විශේෂ | 90 | 85 | 68 | 148 | 165 |
| | ------ | ------ | ----- | ------ | ------ |
| | 348 | 360 | 349 | 475 | 475 |
| | === | ==== | === | ==== | ==== |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009 වර්ෂයට සාපේක්ෂව 2010 සිට 2013 දක්වා, පාරම්පරික විශේෂ, හා උපාධිධාරී වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අඩු වී තිබුණ අතර 2009 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී එය පිළිවෙලින් සියයට 45 කින් හා සියයට 28 කින් අඩුවී තිබුණි.

(ii) ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන් 2009 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලියාපදිංචිය ක්‍රමයෙන් වැඩිවී තිබුණද, 2013 වර්ෂයේදී නැවත අඩු වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී දේශිය හස්ති වෛද්‍යවරුන් ලියාපදිංචි වී නොතිබුණද, කාර්ය සාධන වාර්තාවේ 05 ක් ලෙස දක්වා තිබුණි.

(ඊ) පසුගිය වර්ෂයේ "හෙළවෙද රුවනාර" වැඩසටහන් 04ක් පවත්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 26 දින රු.480,000 ක් වැයකර වෛද්‍ය සහතික පොත් 10,000 ක් මුද්‍රණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එම ශේෂය 10,236 ක් විය. පහත දත්ත අනුව 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පොත් නිකුත් කිරීම් ඉතා පහල මට්ටමක පැවති අතර අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමු කිරීමෙන් තොරව මුද්‍රණය කර තිබූ බව නිරීක්ෂණය විය.

| වර්ෂය | නිකුත් කරන ලද වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව |
|---|---|
| 2011 | 1181 |
| 2012 | 1256 |
| 2013 | 840 |

(ආ) 2013 දෙසැම්බර් 23 දින පැවති වෛද්‍ය සභා රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා රු.54,000 ක අත්තිකාරම් මුදලක් ලබා ගෙන තිබුණි. එම රැස්වීමට සහභාගී නොවූ සාමාජිකයන් 4 දෙනෙකුට අදාළ පැමිණීමේ දීමනාව වූ රු.14,400 වෙනුවට රු.10,800 ක් පමණක් අත්තිකාරම් පියවීමේදී ගෙවා තිබුණි.

## 4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

1998 වර්ෂයේ දී මිලදී ගන්නා ලද වටිනාකම රු.40,780 ක් වූ සිසිල් ශීතකරණය විගණිත දිනය වූ 2014 ජනවාරි 24 දින වන විට ද නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | වාර්ෂික වැටුප | අතිකාල | මුළු මුදල |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| ලේඛකාධිකාරී | 01 | 01 | 129,992 | - | 129,992 |
| ක.සහකාර | 09 | 09 | 2,771,777 | 251,470 | 3,023,247 |
| කා.කම්කරු | 02 | 02 | 376,696 | 21,674 | 398,370 |
| | 12 | 12 | 3,278,465 | 273,143 | 3,551,609 |

කාර්ය මණ්ඩල පුරප්පාඩු නොපැවතුනද නිලධාරීන් අතිකාල සේවයේ යෙදෙන බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂය සඳහා යාවත්කාලීන කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරි සැලැස්ම**

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉටු කල යුතු කාර්යයන් 17 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජ්/2009(1) දරන කලමණාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

8

5.4 විගණන කමිටු

---------------

2010 දෙසැම්බර් 14 දිනැති අංක 55 දරන රජය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විගණන කමිටු පිහිටුවා නොතිබුණි.

5.5 අයවැය ලේඛනමය පාලනය

---------------------------

සමාලෝචිත වර්ෂයේ වියදම්, අයවැයගත වියදම් සමඟ සැසඳීමේදී සැලකියයුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදවාගෙන නොතිබුණි.

6. පද්ධතිහාපාලන

------------------

විගණනයේදී නිරික්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) අතිකාල ගෙවීම්

(ආ) පැමිණීම

(ඇ) නිවාඩු

(ඈ) වාහන කුළීයට ගැනීම

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

වැඩබලන විගණකාධිපති

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල

**<u>ආයුර්වේද වෛද්‍ය සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී)වගන්ති ප්‍රකාර විගණකාධිපති වාර්තාව.</u>**

උක්ත මැයෙන් මා අමතා එවන ලද ඔබේ අංක එච්එම්/සී/ඒඑම්සී/1/13/20 හා 2014.08.12 දින දරන විගණකාධිපති වාර්තාව හා බැදේ.

මුදල් පනතේ 13(8) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාවේ සඳහන් කරුණු පිළිබඳව මාගේ පැහැදිලි කිරීම් පහත පරිදි වාර්තා කරමි.

## 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

### (අ) ආයුර්වේද පනත 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ iiiවන කොටස් ii(i)ඉ වගන්තිය

විගණනයෙන් පෙන්වා දි ඇති කරුණු නිවැරදී බව පිළිගනිමි. එම අඩුපාඩු මඟහරවා ලියාපදිංචිය අලුත් කිරීමෙන් අනතුරුව මෙම කාර්යයා කිරීමට අවශ්‍යා උපදෙස් නිලධාරීන්ට ලබා දී ඇත.

### (ආ) 2005 ජූලි 05 දිනැති අංක 14/13/08(3) දරන ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකාව

නිති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර දැනට එම සංශෝධිත ආචාරධර්ම අනුමත වී ලැබී ඇත. මෙම සංශෝධිත අචාරධර්ම ගැසට් කිරීමෙන් අනතුරුව ඉදිරි කටයුතු ඉටු කළ යුතු බව 2014.02.10 දින 17 වන ආයුර්වේද වෛද්‍ය සභාවේ විසි හත්වන රැස්වීමේ දී තීරණය කරන ලදී.

### (ඇ) <u>ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය</u>

#### i. ආයතන සංග්‍රහයේ xii වන පරිච්ඡේදයේ 36 වන වගන්තිය

මෙම හිඟ මුදල අදාළ නිලධාරියා දැනුවත් කරඇති අතර 2014 වර්ෂය ඉක්ම යාමට ප්‍රථම අදාළ ණය මුදල පියවන බව සඳහන් කරමින් අදාළ නිළධාරියා ලිපියක් ලබා දී ඇත. හැකි ඉක්මණින් මෙම ණය මුදල අයකර ගැනීමට කටයුතු කරන ලෙස ආදාල නිලධාරීන් හට උපදෙස් ලබා දෙන ලදී.

### (ඇ) <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u>

#### i. මුදල් රෙගුලාසි අංක 165

ලැබෙන සියළුම ආදායම් හා වියදම් සඳහා මුදල් පොතක් භාවිතා කරන අතර අතැති මුදල් සඳහා ද වෙනම ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වමි.

(ඈ) **DMS/E3/38/4/241/1-(vol)1අංක දරන 2013 ජුනි 04 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය**

2013.06.14 දින මහා භාණ්ඩාගාර නියෝජිතයකුගෙන් සමන්විත ආයුර්වේද වෛද්‍ය සභාවට යොමු කිරීමෙන් අනතුරුව කමිටු තිරණයට අනුව කාර්ය මණ්ඩලයට දිරිදීමනාව ගෙවීමට අනුමැතිය ලබා දී ඇති බව සඳහන් කරමි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

2013.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිද ආයුර්වේද වෛද්‍ය සභාව අයකරන හා ගෙවනු ලබන ගාස්තු සංශෝධනය සිදුව ඇති බැවින් ආදායම හා වියදම වැඩි වී ඇති බව දන්වමි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

(අ) මෙම තත්වය පිළිගතිමි. 2012.04.03 දින පැවති ආයුර්වේද වෛද්‍ය සභා රැස්වීමේ නියමය පරිදී සංශෝධිත ආචාරධර්ම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර එය සංශෝධනය කර ආපසු වෛද්‍ය සභාවට ලැබී ඇත. ඒ අනුව 2005 ජූලි 15 දින ආයුර්වේද වෛද්‍ය සභා පත්‍රිකා අංක 14/13/08(03) අනුව ගන්නා ලද ලියාපදිංචි ගාස්තුවෙන් 1/4 ක ගාස්තුවක් අයකර වසර 05කට වරක් සියළු වෛද්‍යවරුන්ගේ ලියාපදිංචිය අළුත් කිරීමේ තීරණයට පැවති අවහිරතා ආචාරධර්ම සංශෝධනය කිරීම නිසා මග හැරී ඇති අතර ඉදිරියේ දී ලියාපදිංචි අළුත් කිරීමත් සමඟම ලියාපදිංචි වෛද්‍යවරුන් සංඛ්‍යාව නිවැරදී වන අතර ඉන් යාවත්කාලීන නොවී තිබීම මඟ හැරී යනු ඇත.

(ආ) i. **පාරම්පරික වෛද්‍යවරුන ලියාපදිංචි කිරීමේ විෂය නිර්දේශය සංශෝධනය කිරීමේ අනුකමිටුව**

මෙම කමිටුව දැනට ක්‍රියාකාරී නොමැති බැවින් වෛද්‍ය සභාවට යොමු කර ඉදිරි කටයුතු කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

ii. **අභාවයට යන පාරම්පරික විදුම් පිළිස්සුම් වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීමේ අනු කමිටුව**

මෙම වෛද්‍ය ක්‍රමය පිළිබඳව ආයුර්වේද වෛද්‍ය සභාව සතුව පැවති තොරතුරු දේශීය වෛද්‍ය අමාත්‍යංශය වෙත භාර දී ඇත.

iii. **පශු වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කිරීම පිළිබඳ අනු කමිටුව**

මෙම වෛද්‍ය ක්‍රමය යටතේ හස්ති හා ගව රෝග සඳහා වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

iv. **දේශිය පාරම්පරික දැනුමට අදාළ දත්ත මූලාශ්‍ර පිහිටුවීමේ කමිටුව**

මෙම කමිටුව දැනට ක්‍රියාකාරී නොමැති බැවින් වෛද්‍ය සභාවට යොමු කර ඉදිරි කටයුතු කිරීමට උපදෙස් දෙන ලදී.

**v. දේශීය කැඩුම් බිඳුම් වෙදකම පිළිබඳ වෘත්තිය සංවර්ධන අනු කමිටුව**

වෛද්‍ය සභාවේ ඉල්ලීම අනුව, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය වෙත අප විසින් රැස්කල තොරතුරු ලබා දී ඇති අතර එම ආයතනය මගින් කැඩුම් බිඳුම් වෛද්‍යවරුන්ගේ දැනුම සංරක්ෂණය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) විගණනයෙන් පෙන්වා ඇති කරුණු පිළිගනිමි. ඒ ඒ පාරම්පරික විශේෂ අංශවලට ලියාපදිංචියට ඉල්ලුම් කිරීමේ යම් අඩු වීමක් පෙන්නුම් කරයි. ආයුර්වේද වෛද්‍ය සභාවේ අවධානය මේ පිළිබඳව යොමු කර ඉදිරියේ දී අවශ්‍ය කටයුතු කිරීමට නියමිත බව දන්වමි.

(ඈ) i,ii,

උපාධිධාරී වෛද්‍යවරුන් ගම්පහ වික්‍රමාරච්චි විද්‍යායතනයෙන් හා රාජගිරිය දේශීය වෛද්‍ය විද්‍යාතනයෙන් හා යාපනය විශ්ව විද්‍යාල වලින් සමත් වන වෛද්‍යවරුන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි කරනු ලබයි. ඩිප්ලෝමාධාරීන් ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පරීක්ෂණවලින් සමත් වන අයැදුම්කරුවන් වන අතර ඒ ඒ වර්ෂවල එම ආයතනවලින් සමත්වන අයැදුම්කරුවන් වෙනස් වීමට ලක්වන බැවින් එම තත්වය වෙනස් කිරීමේ හැකියාව ආයුර්වේද වෛද්‍ය සභාව සතු නොවේ.

නමුත් පාරම්පරික සර්වාංග හා විශේෂ වශයෙන් ඉල්ලුම් කරනු ලබන අයැදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාවට සෘජුවම අයැදුම්පත් යොමු කරන අතර සුදුසුකම් සපුරන ලද අයැදුම්කරුවන් වෛද්‍ය අංශ යටතේ ලිඛිත හා වාචික පරීක්ෂණ සඳහා යොමු කර ඉන් සමත් වන අයැදුම්කරුවන් ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා දීමට කටයුතු කරනු ලබයි.

මෙම ක්‍රමවේදය තුළ වසරින් වසර ලියාපදිංචි වන අයැදුම්කරුවන් ගණන වැඩි වීමක් අපේක්ෂා කළ නොහැකි අතර ඉදිරිපත් කරනු ලබන අයැදුම්පත් ගණන අනුව එය වෙනස්වේ.

(ඉ) පිළිගනිමි. සමාලෝචිත වර්ෂයේ දී හස්ති වෛද්‍යවරුන් සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා ඇතත් 2014 වර්ෂයේ සිට අදාළ ලියාපදිංචි කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

(ඊ) විගණනයේ පෙන්වා දී ඇති වැඩසටහන සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කර ගෙන 2015 වර්ෂයේ සිට මෙම වැඩසටහන දීපව්‍යාප්තව පැවැත්වීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) වෛද්‍ය සහතික පරණ පොත් 236 ක් ඉතිරිව පැවතියත් හිටපු ලේඛකාධිකාරිවරයා විසින් මාසිකව සංවිධානය කිරීමට නියමිතව පැවති ජංගම වැඩසටහන් වලදී අලෙවිකිරීම සඳහා වෛද්‍ය සහතික පොත් 10 000ක් මුද්‍රණය කිරීමට හේතු විය. ලේඛකාධිකාරි වරයාගේ හදිසි ස්ථාන මාරුවත් සමඟ මෙම වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

(ආ) විගණනයේ දී පෙන්වා දුන් පරිදි සභාවේ සමාජික මුදල් ගෙවා ඉතිරි වෙතොත් එය ආපසු තැන්පත් කොට විධිමත් පරිදි රිසිට් පතක් නිකුත් කර නිවැරදිව ගිණුම් ගත කර විධිමත්ව පවත්වා ගැනිමට උපදෙස් ලබා දෙන ලදී.

## 4.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

1998 වර්ෂයේ දී මිල දී ගන්නා ලද මෙම ශීතකරණය විගණිත දින වන විට ක්ෂය අඩු කළ වටිනාකම රු. 980.73කි. නමුත් මෙම ශීතකරණය හොඳින් ක්‍රියාත්මක වන අතර , ආයුර්වේද වෛද්‍ය සභාවේ පැවැත්වෙන කමිටු රැස්වීම් හා සම්මුඛ පරීක්ෂණවලට සංග්‍රහ කිරීමේ දී පයොජනවත් වේ. ඉදිරියේ දී මෙම ශිතකරණය අක්‍රිය වුවහොත් අවස්ථානුකූලව සුදුසු පියවරක් ගත හැකි බව වැඩිදුරටත් දන්වමි.

## 4.4. කාර්ය මණ්ඩල පරිපාලනය

අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව ඌන හෝ අතිරික්ත සේවක පිරිසක් නොමැති වුවත් ආයුර්වේද වෛද්‍ය සභාවේ කාර්යය භාරය පුළුල් වී ඇති බැවින් අතිකාල ලබා දීමට සිදුව ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

මේ පිලිබඳව ආයුර්වේද වෛද්‍ය සභාව දැනුවත් කර ඇති අතර 2014.07.11 වන දින රැස්වූ 18/02 වෛද්‍ය සභා රැස්වීමේ දී කමිටුවක් පත් කර ඇති අතර ඉදිරි වර්ෂයේ සිට සංයුක්ත සැලැස්ම නිසි පරිදි යාවත්කාලීන කර ගෙන යාමට කටයුතු කරන බව දන්වමි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

ආයුර්වේද වෛද්‍ය සභාවේ නෛතික රාමුව (අවශ්‍යතා) බල ගැන්වීම හා ආයුර්වේද පනතේ නීතිමය නියෝග සැලසුම් අනුව කටයුතු කරන බව දන්වමි

### 5.3 අභ්‍යන්තර විගණනය

### 5.4 විගණන කමිටු

2012 .06.25 දින අභ්‍යන්තර විගණන කමිටුවක් පත් කර ඇති අතර ඒ අනුව 2012 හා 2013 වර්ෂවල කටයුතු සිදු කරන ලදි. නමුත් 2014.01.30 දින දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ආයුර්වේද වෛද්‍ය සභාව , ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලබන විගණන කමිටුව සඳහා සහභාගි කර ගැනිම සුදුසු බව තීරණය විය. ඒ අනුව කටයුතු කරමින් පවතින දැනුම් දෙමි.

### 5.5 අයවැය ලේඛනමය පාලනය

ඉදිරියේ දී මෙය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග හා උපදෙස් ලබා දීමට කටයුතු කරන ලදී.

## 6. <u>පද්ධති හා පාලන</u>

විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි අදාළ ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු කරමින් නිසි පරිදි කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

පී. එස්. කේ. ආර්. වීරකෝන්
ආයුර්වේද කොමසාරිස් හා
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති

# සංස්ථාපිත තොරතුරු

නම -ආයුර්වේද වෛද්‍ය සභාව

ව්‍යවස්ථාපිත තත්වය -

1927 දී රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුකාරක සභා නිර්දේශය අනුව 1928 දී පිහිටවනු ලැබූ ස්වදේශීය වෛද්‍ය මණ්ඩලය ශ්‍රී ලාංකේය ආයුර්වේද ක්ෂේත්‍රයේ ප්‍රථම නෛතික අධිකාරී බලය ලත් ආයතනය විය. 1935 අංක 46 දරන ලංකායුර්වේද වෛද්‍යානුශාසක සභා ආඥා පනත මඟින් ස්ථාපනය කරන ලද ආයුර්වේද වෛද්‍ය සභාව 1941 අංක 17 දරන ස්වදේශිය වෛද්‍ය ආඥා පනතේ (1945 අංක 49 හා 1949 අංක 49 මඟින් සංශෝධිත) විධිවිධාන යටතේ නැවත ස්ථාපනය කරනු ලැබීය. දූනට ක්‍රියාත්මක ආයුර්වේද වෛද්‍ය සභාව 1961 අංක 31 දරණ ආයුර්වේද පනත යටතේ ස්ථාපනය කරනු ලැබූ ව්‍යවස්ථාපිත ආයතනයකි.

බැංකුකරුවෝ -

1. ලංකා බැංකුව, ( ප්‍රධාන බැංකුකරු )
   මහරගම

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
   ඉතුරුම් නිවස,
   ප්‍රධාන කාර්යාලය,
   කොල්ලුපිටිය.

විගණකයින් -

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නො.306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.


| | | | | | |
|---|---|---|---|---|---|
| සභාපති | | ලේඛකාධිකාරී | 011-5672906 | කාර්යාලය | 011 -5672905 |
| தலைவர் | 011-2847555 | பதிவாளர் | 011-2746754 | காரியாலயம் | 011 -2896911- 1 |
| Chairman | | Registrar | | Office | Ext. 315/316/321 |

Web site :- www.ayurvedicmedicoun.gov.lk E mail :- ayurmc@sltnet.lk

# ස්තූතිය

ගරු දේශීය වෛද්‍ය අමාත්‍යතුමා

ගරු දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

දේශීය වෛද්‍ය ලේකම්තුමා

ආයුර්වේද වෛද්‍ය සභාවේ සියළුම සාමාජික භවතුන්

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

ආයුර්වේද දෙපාර්තමේන්තුව

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

පළාත් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ

සියළුම පළාත් ආයුර්වේද කොමසාරිස්වරුන්

විගණකාධිපති දෙපාර්තමේන්තුව

නීතිපති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

සියළුම ජනමාධ්‍ය ආයතන

සියළුම දිස්ත්‍රික් ලේකම් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල

සියළුම ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා

හා

**ආයුර්වේද වෛද්‍ය සභා කාර්‍ය මණ්ඩලය**

